Prepared by-H.I.NeelaKanthi.

R/sumana Balika Vidayalaya.

Weekly School Department of Education,Sabaragamuwa Province/

නිපුණතාව-04 - විවිධ අත්දැකීම් ඇසුරුකර ගනිමින් නිර්මාණකරණයේ යෙදේ.

නිපුණතා මට්ටම 4.2- ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් සැරසිල්ලක් නිර්මාණය කරයි .

ක්‍රියාකාරකම 4.2 - යහනක් නිර්මාණය කිරීම.

- **<u>නිවැරිදි පිළිතුර තෝරන්න.</u>**

1.යක් තොවිල් වලදී සහ මඩුතෝත්‍ර වලදී තුණුරුවනු හා දෙවියන් වෙනුවෙන් පූජා ද්‍රව්‍ය තබන ස්ථානය --------ලෙස හැදින් වේ.

1. අයිලය 2. මඩුව 3. යහන 4.කත්තිරික්කය

2.මඩුතෝත්‍ර වලදී ප්‍රධාන තොරණට සමාන්තරව ඉදිකෙරෙන දේව මල් යහන් ගණන

1. 5 කි 2. 8කි 3. 6 කි 4. 1 කි

3. යක් තොවිල් වලදී ඉදිකෙරෙන මල් යහන් ගණන

1. 5 කි 2. 8කි 3. 6 කි 4. 1 කි

4.දුව දඬු උපයෝගී කර ගනිමින් යහනේ තට්ටුව සාදා ගන්නේ

1. ත්‍රිකෝණාකාරවය 2.සමචතුරස්‍රාකාරවය 3.සෘජුකෝණාස්‍රාකාරවය 4.ගෝලාකාරවය

5.යහනක් සාදනු ලබන සාමාන්‍ය උස ලෙස සැකෙන්නේ

1.තනමත්තකි 2. තුන්වියත් තුනගුලකි 3.අඩියකි 4. අඩි තුනකි

- **<u>හිස්තැන් සදහා නිවැරදි පිළිතුරු යොදන්න.</u>**

6.යහනේ ඉදිරිපස අලංකාර කර ගැනීම සඳහා ---------------- යොදා ගනී.

7.යහන මත ඇති පූජා ද්‍රව්‍ය පෙනීම සඳහා කුඩා ---------- සැකසීමේ සිරිතක් ඇත.

8.ශාන්තිකර්ම වල යහනට අමතරව දක්නට ඇති සැරසිළි ---------------- --------------- දෙකකි .

9. ---------කොහොඹා කංකාරි ශාන්ති කර්මයට පමණක් ආවේනික සැරසිල්ලකි.

10.යහනේ මූලික ආකෘතිය ( සැකිල්ල) නිර්මාණය කර ගැනීම සඳහා ---------------- උපයෝගී කර ගනී.

- **<u>ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.</u>**

11. මල් යහන ශාන්තිකර්ම භූමියේදී ඉතා වැදගත් පූජනීය ස්ථානයක් ගනී . මෙම කියමන සනාත කරන්න .

12. යහනක් නිර්මාණය කිරීමට අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය නම් කරන්න.

13.නර්තන සම්ප්‍රදායන් තුනෙහි යහන් වල ඇති සුවිශේෂතා පිළිබඳ පැහැදිළි කරන්න.

14.නිවැරදි විධි ක්‍රම භාවිතා කරමින් යහනක් නිර්මාණය කර ගන්නා ආකාරය පැහැදිළි කරන්න.